සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - සැප්.- 4

විෂය - ගිණුම්කරණය

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

1. සීමිත බියුමාලි සමාගම සම්බන්ධ පහත තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | රු.000 |
|---|---|
| 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 1,000 |
| 2018 වර්ෂය සඳහා ගෙවූ අතුරු ලාභාංශ | 600 |
| 2018.03.31 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 4,000 |
| 2017.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | 3,000 |
| 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොලී වියදම | 300 |
| 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම | 200 |

පහත දෑ ගණනය කරන්න.

1.) පොලී ආවරණ අනුපාතය (වාර)

2.) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (වසර අග හිමිකම මත)

2. නිපුන නිෂ්පාදන සමාගමේ එකලස් හා නිමැවුම් අංශවලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | එකලස් අංශය | නිමැවුම් අංශය |
|---|---|---|
| ඒකකයක් නිපදවීමට අවශ්‍ය කාලය | යන්ත්‍ර පැය 4 | ඍජු ශ්‍රම පැය 5 |
| පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය | යන්ත්‍ර පැයට රු.60 | ඍජු ශ්‍රම පැයට රු.10 |

ඒකකයක ප්‍රාථමික පිරිවැය රු.710කි.

ඒකකයක් නිෂ්පාදන පිරිවැයට 50%ක ලාභයක් සහිතව අලෙවි කරනු ලැබේ.
වාර්ෂික නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය රු.1,200,000 කි.
වාර්ෂික නිෂ්පාදනය සහ විකුණුම් ඒකක 200කි.

මෙම ආයතනයේ,

1.) ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය රු..............................කි.

2.) ඒකකයක ලාභය/අලාභය රු..................................කි.